**ලංසු කැඳවීම**

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

**1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සහ**

**2002 අංක 17 දරණ මැනුම් පනත යටතේ**

**මැනුම් සිදු කර කැඩැස්තර සිතියම් සකස් කිරීම - 2026**

**ලංසු අංකය - SD/II/2026**

1. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙනුවෙන් සර්වේයර් ජනරාල් විසින් 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සහ 2002 අංක 17 දරණ මැනුම් පනත යටතේ මැනුම් සිදුකර කලාප **200** ක ඉලක්කගත වැඩ ප්‍රමාණයක් 2026 වර්ෂයේ නිම කිරීම සඳහා කොළඹ, ගම්පහ, කළුතර, රත්නපුර, කෑගල්ල, ගාල්ල, මාතර, හම්බන්තොට, කුරුණෑගල, පුත්තලම, මහනුවර, මාතලේ, නුවරඑළිය, අනුරාධපුර, පොළොන්නරුව, මොණරාගල, යාපනය, බදුල්ල, අම්පාර හා මඩකලපුව යන දිස්ත්‍රික්කයන්හි මැනුම් සිදු කර කැඩැස්තර සිතියම් සකස් කිරීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමට දිවයිනේ සියළුම ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවන් වෙත කෙරෙන ආරාධනයයි.

2. ලංසු කැඳවීම ජාතික තරඟකාරි ලංසු කැඳවීමේ ක්‍රමවේදය මත සිදු කෙරේ.

3. උනන්දුවක් දක්වන ලංසු තබන්නන්හට මිල ගණන් කැඳවීමේ ලංසු පත්‍රය, ප්‍රසම්පාදන කොන්දේසි හා පිරිවිතර සහ අනෙකුත් අදාළ ලේඛණ www.survey.gov.lk දෙපාර්තමේන්තු වෙබ් අඩවිය තුලින් බාගත කර ගත හැක.

4. ලංසු පත් එවීමේදී දිවයිනේ ඉහත සඳහන් දිස්ත්‍රික්ක සඳහා ආපසු නොගෙවනු ලබන රු. **1,000/-** ක මුදලක් බැගින් දිවයිනේ ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු / පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල, දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය හෝ සර්වේයර් ජනරාල් කාර්යාලය වෙතට හෝ මාර්ග ගත ගෙවීම් ක්‍රමය ඔස්සේ හෝ ගෙවා ලබා ගන්නා ලද ලදුපතෙහි පිටපතක් ඊට අමුණා එවිය යුතුය.

5. නියමිත ආකෘතියට අනුව නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු පත් **2026-05-19** දින පෙ.ව. **10.00** ට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ ප්‍රසම්පාදන හා සැපයුම් අංශයේ ඇති අදාළ ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හැක. ලංසු පත් ඇතුලත් මුද්‍රාතබන ලද කවරයේ ඉහල වම් කෙලවරේ **"....................... දිස්ත්‍රික්කයේ කැඩැස්තර සිතියම් සකස් කිරීම සඳහා මිළ ගණන්"** ලෙස සටහන් කළ යුතුය. ලැබෙන ලංසු පත් එදිනම පෙ.ව.10.05 ට විවෘත කරනු ලැබේ.

6. ලංසු පත් එවිය යුතු ලිපිනය : ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි, ප්‍රසම්පාදන හා සැපයුම් අංශය, සර්වේයර් ජනරාල් කාර්යාලය, අංක 150, බර්නාඩ් සොයිසා මාවත, කොළඹ 05.

7. ප්‍රමාද වී ලැබෙන ලංසු පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සර්වේයර් ජනරාල්,<br>
සර්වේයර් ජනරාල් කාර්යාලය,<br>
අංක 150,<br>
බර්නාඩ් සොයිසා මාවත (කිරුළ පාර),<br>
කොළඹ 05.<br>
2026-04-24